150218 - 11

"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු."

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

"ශ්‍රාවස්ති මන්දිරය", 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
"சிராவஸ்தி" கட்டடம் ,32, ஸ்ரீமத் மார்க்கஸ் பெர்னாந்து மாவத்தை, கொழும்பு 07.
"Sravasthi Mandiraya", 32, Sir Marcus Fernando Mawatha, Colombo 07.

| | | | |
|---|---|---|---|
| ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary | දුරකථන / தொலைபேசி / Telephone - 2698409<br>ෆැක්ස් / பெக்ஸ் / Fax - 2694667<br>ඊ-මේල් / ஈமெயில் / Email chiefsecretary@wpc.gov.lk | පොදු දුරකථන / தொலைபேசி / General Telephone | 2682868<br>2682869<br>2682870 |

මගේ අංකය. / எனது இல. / My No. CSO/FIN/2/3/10(ii)    ඔබේ අංකය. / உமது இல. / Your No.    දිනය. / திகதி. / Date. 2015.02.

## මුල්‍ය චක්‍රලේඛ 03/2015

OFFICE OF THE GOVERNER WESTERN PROVINCE
1/7/1/2(8)
16 FEB 2015
COLOMBO

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
පළාත් කොමිෂන් සභාවල ලේකම්වරු (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.),
දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් (බ.ප.),
අධිකාරිවල සභාපතිවරු (බ.ප.).
බස්නාහිර පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරු.

### <u>සහනදායී මෝටර්රථ බලපත්‍ර නිකුත් කිරීම.</u>

උක්ත මැයෙන් යුතුව මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2014.12.16 දිනැති වැටුප් හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2013(111) හා බැඳේ. (එම චක්‍රලේඛයේ පිටපතක් මේ සමග අමුණා එවමි.)

02. ආණ්ඩුකාර ලේකම්ගේ අංක 1/7/1/1 හා 2015.01.29 දිනැති ලිපිය මඟින් ඉහත සඳහන් චක්‍රලේඛය බස්නාහිර පළාත් සභාවට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව දැනුම් දී ඇත.එහෙයින් මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

ජේ.එම්.සී.ජයන්ති විජේතුංග
ප්‍රධාන ලේකම්,පළාත් මුදල්
අමාත්‍යාංශ ලේකම් හා පළාත්
භාණ්ඩාගාර ලේකම් ,
බස්නාහිර පළාත.

පිටපත්:01. විගණකාධිපති.
02. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණක)
03. පරිගණක දත්ත ක්‍රියාකරු.

# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் அமைச்சு
# MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01 Sri Lanka

| | | |
|---|---|---|
| කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700 | ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823 | වෙබ් අඩවිය / வெப் தளம் / Website: www.treasury.gov.lk |
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2014.12. 16 |


**වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2013 (III)**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් වෙත

<u>සහනදායී මෝටර් රථ ආනයන බලපත්‍ර නිකුත් කිරීම</u>

ගරු අග්‍රාමාත්‍යතුමා විසින් 2011.11.24 දිනෙන් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 11/2206/502/007 සඳහා ලබා දී ඇති 2014.10.16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, එහි සඳහන් නිලධාරීන් ද ඇතුළත් කරමින් 2013.08.02 දිනැති වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2013 පහත පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලබන අතර එය 2014.12.17 දින සිට ක්‍රියාත්මක වේ.

01. යෝග්‍යතාවය

01/2013 චක්‍රලේඛයෙහි 01 ඡේදයේ 01.01හි (ඒ) වගන්තියට ඉනික්බිතිව පහත සඳහන් (ඔ) වගන්තිය ඇතුළත් කරනු ලැබේ.

(ඔ). ගරු අග්‍රාමාත්‍යතුමාගේ, ගරු කථානායකතුමාගේ, ගරු ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන්ගේ, ගරු අමාත්‍යවරුන්ගේ, ගරු නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ, ගරු නියෝජ්‍ය කථානායකතුමාගේ සහ පාර්ලිමේන්තුවේ කාරක සභා සභාපතිතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සහ අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ සම්බන්ධීකරණ ලේකම්වරුන් [මෙම නිලධාරීන් 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි 19(ඇ) ඡේදය පරිදි නියමිත වැටුපෙහි පිහිටුවා වැටුප් ලබන/ලබා ඇති, වසර 05 ක් හෝ ඊට වැඩි සක්‍රීය සේවා කාලයක් අඛණ්ඩව හෝ වරින් වර සපුරා ඇති වර්තමානයේ ද ධූරය දරන නිලධාරීන් විය යුතු අතර, ගරු අමාත්‍යවරුන් හා ගරු නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ අනුමත කාර්ය මණ්ඩලයේ නිලධාරීන් පිළිබඳව කටයුතු කිරීමේ දී ජනාධිපති ලේකම්ගේ අංක සීඒ/1/17/1 හා 2010.05.14 දිනැති චක්‍රලේඛයේ 2.1 ඡේදයේ සඳහන් කර ඇති විධිවිධාන අදාළ වේ].

02. කොන්දේසි, නියමයන් සහ සහන

02.01 ඡේදයෙහි (අ) යටතේ පහත සඳහන් (v),(vi) වගන්ති ඇතුළත් විය යුතුය.

(අ) (v). මෙම ක්‍රමය යටතේ බලපත්‍ර ලැබීමට සුදුසුකම් ලබන ඉහත 01 ඡේදයෙහි 01.01 (ඔ) යටතේ සුදුසුකම් ලබන නිලධාරීන් ආනයනය කරනු ලබන/ මිලදී ගනු ලබන (දේශීයව නිෂ්පාදිත) මෝටර් රථයේ උපරිම මි.ර.ගා. (CIF) වටිනාකම ඇ.එ.ජ. ඩොලර් 30,000 හෝ අනෙකුත් පිළිගත් පරිවර්තිත මුදල් ඒකකයකින් ඊට සමාන වටිනාකමක් විය යුතුය.

(vi). ඉහත 01 ඡේදයේ 01.01 (ඔ) යටතේ සුදුසුකම් ලබන නිලධාරීන්ට ආනයනය/ දේශීය නිෂ්පාදිත මෝටර් රථයක් මිලදී ගැනීම කල හැකි වන්නේ පහත දැක්වෙන 2.1(i) වගුවෙහි සඳහන් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු යටතේ පමණි.

2.1 (i) වගුව

| සිලින්ඩර ධාරිතාව (පෙට්‍රල්/ඩීසල්) | ගෙවිය යුතු නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද (%) |
|---|---|
| 1000cc | 70 |
| 1600cc | 75 |
| 2000cc | 90 |
| 2600cc | 100 |
| 2600cc ට වැඩි | 110 |

03. ක්‍රියාපටිපාටිය

03 ඡේදයෙහි (ඇ) වගන්තියට ඉනික්බිතිව (ඉ), (ඊ) සහ (උ) යන වගන්ති ඇතුළත් විය යුතුය.

(ඉ) ඉහත 01 ඡේදයේ 01. 01 (ඔ) යටතේ සුදුසුකම් ලබන නිලධාරීන් විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්, ජනාධිපති ලේකම්ගේ අංක සීඒ/1/17/1 හා 2010.05.14 දිනැති චක්‍රලේඛයට අනුව අදාළ තනතුරට පත් කිරීමේ ලිපියේ සහතික කළ පිටපතක් ද සමඟ අධ්‍යක්ෂ ජනරාල්, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

(ඊ) ඉහත 01 ඡේදයේ 01. 01 (ඔ) යටතේ සුදුසුකම් ලබන නිලධාරීන් සුදුසුකම් ලැබීම සඳහා පෙර සේවය කරන ලද තනතුරුවල සේවා කාලයන් අදාළ කරගන්නේ නම්, එසේ දරන ලද තනතුරු සම්බන්ධයෙන් ඒ බව තහවුරු කරන ලිපි අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කල යුතුය.

(උ) ඉහත 01 ඡේදයේ 01. 01 (ඔ) යටතේ සුදුසුකම් ලබන නිලධාරීන් සඳහා මෙම ක්‍රමය යටතේ බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ බලපත්‍රලාභියා විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු පදනම් කරගෙන බැවින්, එම තොරතුරුවල නිරවද්‍යතාවය පිළිබඳව තහවුරු කර ගැනීමෙන් පසු පමණක් අග්‍රාමාත්‍ය ලේකම් / පාර්ලිමේන්තු මහ ලේකම් / අමාත්‍යාංශ ලේකම්

විසින් අයදුම්පත්‍රය පෞද්ගලිකවම නිර්දේශ කල යුතු වේ. එසේ නිර්දේශ කර ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් සඳහා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් බලපත්‍රය නිකුත් කරනු ලැබේ.

පී.බී. ජයසුන්දර

මහා භාණ්ඩාගාරයේ ලේකම් සහ

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. පාර්ලිමේන්තු මහ ලේකම්
4. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
5. ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන්ගේ ලේකම්
6. විගණකාධිපති
7. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව
8. කොමසාරිස් ජනරාල්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
9. කොමසාරිස් ජනරාල්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
10. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව